# ශ්‍රී ලංකාවෙන් හමුවන වහරල සෙල්ලිපිවලින් හඳුනාගත හැකි සම කාලීන සමාජ ක්‍රියාකාරීත්වය පිළිබඳ අධ්‍යයනයක්

**ආර්.එම්.එම්. රාජපක්ෂ**
අභයගිරි විහාර ව්‍යාපෘතිය, මධ්‍යම සංස්කෘතික අරමුදල, අනුරාධපුරය.
mangalikarajapaksha90@gmail.com

ප්‍රමුඛ පද : අභිලේඛන, වහරල, වහල් බව, සමාජ පුරාවිද්‍යාව

## හැඳින්වීම

මෙ රට ඉතිහාසය අධ්‍යයනය කිරීමට ඇති මූලාශ්‍ර අතුරින් වැදගත් පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයක් වශයෙන් සෙල්ලිපි හඳුන්වා දිය හැකි ය. වහරල යනුවෙන් ශිලාලේඛන වර්ග කිරීමකට ලක් නොවූව ද එකී වචනය නිසා ම වහරල ලිපි යනුවෙන් හඳුන්වනු ලබයි. මෙ රට අභිලේඛන සාහිතයයක් ගොඩනැගී මේ වනවිට බොහෝ කලක් ගත වුව ද තවමත් ඒ තුළ ඒකමතියක් හඳුනාගත නො හැක. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ මෙතෙක් ශ්‍රී ලංකාවෙන් හමු වී ඇති වහරල ලිපි අධ්‍යයනය කරමින් ඒ තුළින් අනාවණය කර ගත හැකි සමාජය හා ලිඛිත මූලාශ්‍රවල සඳහන් සමකාලීන සමාජය (වහරල ලිපිවලින් අනාවරණය කර ගතහැකි කරුණුවලට අදාළ ව) සංසන්දනය කරමින් සමාජ . ක්‍රීයාකාරිත්වය සම්බන්ධයෙන් අදහසක් ඉදිරිපත් කිරීමයි.

## ක්‍රමවේදය

උක්ත පර්යේෂණය සිදු කිරීමේ දී මූලික වශයෙන් දත්ත රැස්කිරීමේ ක්‍රමවේද ලෙස පුස්තකාල ගවේශනය, ක්ෂේත්‍ර අධ්‍යයනය, ඡායාරූප ලබා ගැනීම හා සම්මුඛ සාකච්ඡා යන ක්‍රමවේදයන් භාවිත කරන ලදී. දත්ත විශ්ලේෂණය කිරීමේ දී හඳුනාගන්නා ලද දත්ත වගුගත කරන ලදී. ඉන්පසු විශ්ලේෂණය කරමින් සමකාලීන සමාජය සම්බන්ධයෙන් අදහසක් දීමට බලාපොරොත්තු වේ. ශ්‍රී ලංකාවේ වාර්තාගත කර ඇති වහරල ලිපි 75ක් පමණ මෙම අධ්‍යයනය සඳහා යොදා ගැනේ.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

ශ්‍රී ලංකාවේ හමුවන වහරල ලිපි ක්‍රිස්තු වර්ෂ 5, 6 හා 7 යන සියවස්වලට අයත් වේ. වහරල යන්නෙහි අදහස සම්බන්ධයෙන් විවිධ විද්වතුන් විවිධ අදහස් දක්වා ඇති අතර මෙහි දී ඒ සම්බන්ධයෙන් අවධානයට ලක් නොවේ.

අධ්‍යයනය කරන ලද වහරල ලිපි දෙස බැලීමේ දී පොදුවේ එම ලිපිවල හඳුනාගත හැකි අංග කිහිපයක් දක්නට ලැබේ.

1 දායකයාගේ නම
2 දායකයාගේ ගම
3 ඔහුගේ තනතුර හෝ රැකියාව

4 කරන ලද දේ
5 දෙන ලද දීමනාවේ ප්‍රමාණය
6 අනුමෝදනාව

**පුද්ගල නාම**

මේ යටතේ ආකාර දෙකක පුද්ගල නාම හඳුන්වා දිය හැකි ය. එනම් රජවරුන්ගේ නම් හා සමාජයේ අනෙක් පිරිසගේ නම් වශයෙනි. රාජ නාම හැරුණු විට අනෙක් නම් සමාජය තුළ ග්‍රාමීය නායකත්වයක් දැරූවන් හා සාමාන්‍ය මහජනතාව ලෙස හඳුන්වා දිය හැකි ය. එක් වහරල ලිපියක් තුළ බොහෝ අවස්ථාවල දී පුද්ගල නාම එකකට වැඩි අවස්ථා පවතී. උදා: වෙස්සගිරිය අංක 4 වහරල ලිපියේ සහසවරල, දලමෙය, සකනකන වෙසමිනිය යනුවෙන් නම් තුනක්ම දැක් වේ (Paranavitana1943:128-139).

මෙම ලිපි බොහොමයක දරුවන්, බිරිඳ, සොහොයුරන් ආදි වශයෙන් පවුලේ පිරිස් සම්බන්ධ කොට ලියා තිබේ. අන්තර්ගත නම් ශිලා ලේඛනවලට පොදු නොවූ සාමාන්‍ය ජනයා අතර පැවති යැයි සිතිය හැකි නම් විය හැකි ය. එක් ලිපියක සඳහන් නමක් තවත් වහරල ලිපියක දැකගත නො හැක. වහරල ලිපි හැරුණු විට සමකාලීන අනෙක් ලිපිවල ද මෙම නම් හඳුනා ගැනීමට අපහසු ය. මෙහි පුද්ගල නාම හඳුනාගත හැකි පුද්ගල නාම කිහිපය ඇසුරින් ඒවායෙහි ස්ත්‍රී පුරුෂ භාවය හෝ ඔවුන්ගේ ඥාතීත්වයන් තේරුම්ගත නොහැක. කෙසේ වෙතත් මෙම නම් සියල්ල පුරුෂයන්ට අයත් සංඥා නාම යයි අනුමාන කළ හැකි ය.

**ස්ථාන නාම**

මෙහි දී ගම් හෝ ප්‍රදේශ පිළිබඳවත් බෞද්ධ විහාරාරාම පිළිබඳවත් කරුණු අධ්‍යයනය කළ හැකි ය. වෙස්සගිරිය ලිපි අංක 01හි ලතකතල නම් ග්‍රාම නාමය හාබොය උපුල්වන් කස්සපගිරි විහාරය(Paranavitane, 1943:128-139) ඊට නිදර්ශනයක් ලෙස දැක්විය හැකි ය.සමහර වහරල ලිපිවලින් ආරණ්‍යවල නම් ද හෙළි කරගත හැකි ය (එම, 137-141). පාලුහංගමුව එක් වහරල ලිපියක උත්තර දේශය යන්න සඳහන් වී තිබේ (Dias1991:87). සමහර අවස්ථාවල දී ප්‍රදේශයේ නම හා විහාරයේ නම එකම ලිපියේ දැකගත හැකි නමුත් වෙන් වෙන්ව හඳුනාගත හැකි අවස්ථා ද පවතී. හඳුනාගත හැකි ග්‍රාමනාම වර්තමානයේ පවතී ද නැති ද යන්න හඳුනාගත නො හැක.

**වෘත්තීය නාම**

වහරල ලිපිවල අන්තර්ගතය දෙස බැලූ විට එතරම් උගත් පිරිසක් විසින් මෙම ලිපි රචනා කර ඇති බවක් නොපෙනේ. ඊට හේතුව ලිපි කොටවන ලද පුද්ගලයන්ගෙන් තම වෘත්තිය සඳහන් කළ අය අතුරින් බහුතරයක් උළු වඩුවන් වීම යි. ඔලුවඩු (Paranavitane, 1943:128-139), උලුවඩු(එම), උලුවදු (එම,137-141) ආදී ස්වරූපවලින් එය හඳුනාගත හැකි ය. ඒ හැර ව්‍යාපාරිකයින් (එම) වඩු කාර්මිකයින් (Uduwara1991:120-125)

රජු කෙරෙහි සේවයේ යෙදුණු සෙනවිවරු (Paranavitane 1955:27-29) අමාත්‍යවරු (Dias 1991:82-83) ගුරුවරු (හෙට්ටිආරච්චි නැත, 31-36) ආදී වෘත්තිකයන් හඳුනා ගැනීමට හැකි විය. මේ ආකාරයෙන් හෝ වෘත්තිය සඳහන් කර ඇති පිරිස වහරලබවෙහි යෙදී සිටි පිරිසක් නොව වහරල සේවයෙහි යෙදී සිටියවුන් නිදහස් කර ගන්නා ලද පිරිසකි. බොහෝ පිරිස් තම වෘත්තිය සඳහන් කර නැති ආකාරයක් දක්නට ඇති අතර එම නිසා ඔවුන් ග්‍රාමීය මට්ටමේ සාමාන්‍ය මිනිසුන් විය හැකියැයි අනුමාන කළ හැකි ය.

### පැවිදි සමාජය

බොහොමයක් වහරල ලිපි විහාරයක් ආශ්‍රය කොට ගෙන හමුවන අතර බොහොමයක් ලිපිවල යම්කිසි බෞද්ධ විහාරයක නමක් හෝ ආරණ්‍යයක නමක් හඳුනාගත හැකි ය. ඒ අනුව මෙකී වහරල ලිපි විශේෂය රචනා කළ පිරිස විහාරයක් කේන්ද්‍ර කරගෙන තම සේවාව සැපයූ පිරිසක් විය හැකි ය. විහාරස්ථානයක නාම හැරුණු විට කුඩාරත්මලේ ලිපියේ "පුවිජයි සිධථ" යනුවෙන් දක්වා ඇත්තේ පැවිදි සිද්ධාර්ථ යන අදහස දීමට ය (Paranavitane, 1955:30-34). නිලගම වහරල ලිපිවල සඟ යන්න සඳහන් වේ (හෙට්ටිආරච්චි නැත: 31-36). කුඹුක්කන්දන ශිලාලේඛනයේ භික්ෂුවක් පිළිබඳ සඳහන් කරනත් නම හඳුනාගැනීමට නොහැක Dias, 1991:186).

### ආකෘතික ලක්ෂණ

ක්‍රිස්තු වර්ෂ 5-6 සියවස්වල හඳුනාගත හැකි වහරල ලිපිවල ආකෘතික ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කිරීමේ දී සමකාලීන අනෙකුත් ලිපි ලියා ඇති ආකෘතියට වඩා වෙනස් ස්වරූපයක් ගනී. මෙම වර්ගයේ ලිපිවල ආකෘතිය කෙරෙහි උගතුන් දක්වා ඇති අවධානය ද ප්‍රමාණවත් නොවන බව පෙනේ. වහරල ලිපි බොහෝ විට පයට පෑගෙන ස්ථානයක ලිපිය සටහන් කර තිබීම හඳුනා ගැනීමට හැකි ය. සඳකඩපහනක්, පියගැටපෙළක් ආදී තැනක බෙහොමයක් වහරල ලිපි හඳුනාගත හැකි ය. සමකාලීන අනෙකුත් ශිලාලේඛන හා සංසන්දනය කරන විට ශිලාලේඛනයක් පිහිටුවීම වෙනුවෙන් ම ගල්තලය සකස්කර නොතිබීම හඳුනාගත හැකි විශේෂ ලක්ෂණයකි. අකුරු පේළි එකමත එක හෝළංව ලියා ඇති අතර ඒවා විවිධ ප්‍රමාණවලින් ද යුක්ත වේ (ඡායාරූප අංක 1). විටෙක සම්මත ව්‍යාකරණයෙන් හා සම්මත අක්ෂර වින්‍යාසයෙන් බැහැර වී ඇති ආකාරයක් දැකගත හැකි අතර බොහෝ විටබෞද්ධ විහාර ඇසුරු කරමින් ස්ථානගත වීම වැනි ලක්ෂණ වහරල ලිපි පිළිබඳව අවධානය යොමු කිරීමේ දී දැකගත හැකිය. ඒ අනුව එක්තරා පිරිසකගේ විශේෂ අවශ්‍යතාවක් අරමුණු කරමින් මෙම ලිපි සටහන් කළා විය හැකි ය. මෙම ලිපි බොහොමයක් අසම්පූර්ණ වාක්‍යවලින් යුක්ත ය. මේ කාලයේ අකුරු පුහුණු වන්නන් විසින් ලිපි

සටහන් කළා ද යන්න පිළිබඳ සිතුණ ද එවැන්නක් ගැන සඳහන් වන්නේ නැත. සමහර ලිපිවල ඇත්තේ වක්‍යංශයක් පමණි. සමහරු එය ලිපි කැබැල්ලක් ලෙස හඳුනාගන්නා අවස්ථා ද පැවතිය හැක. ඓතිහාසික තොරතුරු බෙහෙවින් අල්ප ය.

ලේඛනගත මූලාශ්‍රවලට අනුව ක්‍රිස්තු වර්ෂ 5-7 සියවස්වල විහාරාරාම පාලනය හා එහි ක්‍රියාකාරිත්වය කෙරෙහි විමසීමේ දී සමකාලීන සමාජයේ ආරාමයක පාලනය මුළුමනින් ම සංඝයා සතු කටයුත්තක් විය (රාහුල හිමි1999:143). ආරාමයක සංඝයා ද ආරාමිකයන් ද විහාර ගම්බිම් ආදිය පිළිබඳව ද ව්‍යවස්ථා පැවති අතර දාසයන් පිළිබඳ පැවති ව්‍යවස්ථාද විය (එම: 141). විහාරවලට අයත් වූ දාසයන් හා වහලුන් ද ආරාමිකයන් ලෙස හඳුන්වා තිබේ (ගුණවර්ධන, 1993:98). මේ අනුව විශාල ප්‍රදේශයක ව්‍යාප්ත වූ බෞද්ධ විහාරාරාමවල කටයුතු සිදු කිරීම සඳහා සිටි සේවකයන් අතුරින් දාසයන් නැතිනම් වහලුන් යනු එක් කොට්ඨාශයක් විය හැක. එහෙත් මොවුන් ග්‍රීසිය වැනි රටවල පැවති පෞද්ගලික නිදහසක් කොහෙත්ම නැති පිරිසක්නම් නොවේ (අමරවංශ හිමි, 1996:39). ආරාමවලට ආදායම් ලැබුණු අපූරු ක්‍රමයක් ලෙස ආරාමවල දාසයන්ගේ නඩත්තුව පිණිසත් ඔවුන් දාසකමෙන් මුදවාලීම පිණිසත් මුදල් පූජා කිරීම හැඳින්විය හැකි ය (රාහුල හිමි1999:151).

ඉහත සඳහන් සංක්ෂිප්තගත තොරතුරු අනුව වහරල ලිපි තුළින් සමකාලීන සමාජයේ පැතිකඩක් කෙරෙහි අදහසක් ඉදිරිපත් කළ හැකි ය. මෙම ලිපිවල අන්තර්ගතය හා ආකෘතිකමය ලක්ෂණ තුළින් අනාවරණය කරගත හැකි සමාජ පුරාවිද්‍යාත්මක කරුණු කෙරෙහි අවධානය යොමු කළ අතර පරණවිතාන විසින් අර්ථ දක් වූ වහල් පිරිසක් සම්බන්ධයෙන් යම්කිසි විග්‍රහයක් ඉදිරිපත් කළ හැකි ය. එය ඔහු විසින් දක්වන ලද ආකාරයේ වහල් සේවාවක්නම් නොවිය හැක. ඒ අනුව මෙයින් කියැවෙන පිරිස විහාරයක් වෙත තම සේවාව හෝ රාජකාරිය අනිවාර්යයෙන් ඉටු කළ අතර ගෙවීමක් කර ඉන් මිදිය හැකි වූ ක්‍රියාවලියක් විය හැකි බව නිගමනය කළ හැකි ය. ඒ අනුව වහරල යන්නෙන් අර්ථ ගැන්වෙන්නේ එකී සේවාව විය හැකි ය. අවසාන වශයෙන් විහාරාරාමයක් වෙත තම සේවාව සැපයූ සමාජයේ උසස් යැයි සම්මත පවුල්වලින් තොර පුද්ගල කොට්ඨාශයක් පිළිබඳ වහරල සෙල්ලිපි තුළින් හඳුනාගත හැකි බව නිගමනය කළ හැකි ය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


ගුණවර්ධන, රණවීර (1993), සිවුර සහ නඟුල, සමාජ විද්‍යාඥයින්ගේ සංගමය, කොළඹ.

රාහුල හිමි, වල්පොළ (2002), ලක්දිව බුදුසමයේ ඉතිහාසය, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

Dias, Malini (1991), Epigraphical Notes, Department of Archaeology, Colombo.